# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 ජනවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 17 දරන
දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 60/72.

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම පනතෙහි 5අ වන වගන්තිය වශයෙන් එය බලපැවැත්විය යුතු ය :— 5අ යන අලුත් වගන්තියක් 1963 අංක 4 දරන පනතෙහි ඇතුළත් කිරීම.

'මැණික් වෙළඳාමෙහි ඇතැම් ලාභ නිදහස් කිරීම.

5අ. (1) 1972 අප්‍රේල් 1 වන දින සිට,—

(අ) රාජ්‍ය මැණික් සංස්ථාවෙහි ලාභ සහ ආදායම ;

(ආ) රාජ්‍ය මැණික් සංස්ථාවට මැණික් විකිණීමෙන් යම් තැනැත්තකු විසින් ලබන්නා වූ ලාභ සහ ආදායම ;

(ඇ) 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි 16 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයක බලය යටතේ මැණික් අපනයනය කිරීමෙන්, හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සංචාරකයන්ට මැණික් විකිණීමෙන් යම් තැනැත්තකු විසින් ලබන්නා වූ ලාභ සහ ආදායම ; සහ

(ඈ) යම් සමාගමකට ලැබුණා වූ මෙහි (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන් කර ඇති ලාභවලින් සහ ආදායමෙන් ඒ සමාගමේ කොටස්කරුවන්ට ගෙවනු ලබන ලාභාංශයක්

ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

1—කේ 17372—11,308 (72/10)

(2) මේ වගන්තියෙහි—

"මැණික්" යන්නට 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි දී ඇති අර්ථය ම ඇත; තව ද

"රාජ්‍ය මැණික් සංස්ථාව" යන්නෙන් 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත යටතේ පිහිටුවනු ලද රාජ්‍ය මැණික් සංස්ථාව අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

"අනුමත කරනු ලැබූ කාර්මික ව්‍යාපාරවල අපනයන වෙළඳාමෙන් ලැබෙන ලාභ සහ ආදායම නිදහස් කිරීම.

7. (1) කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් කාර්මික ව්‍යාපාරයක ද්‍රව්‍ය හෝ භාණ්ඩ කිසිවක අපනයන වෙළඳාමෙන් ලබන්නා වූත් ඒ ද්‍රව්‍ය හෝ භාණ්ඩ පළමුවරට අපනයනය කරනු ලැබූ වර්ෂයකට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වූ හා ඉන් පසුව එළඹෙන තක්සේරු වර්ෂ දෙකෙන් එක් එක් වර්ෂය සඳහා වූ ලාභ සහ ආදායම වන්නා වූත් ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය:

එසේ වුව ද 1965 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ලාභ සහ ආදායම් කිසිවකට මෙම උපවගන්තියෙහි කිසිවක් අදාළ නො විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි කාර්යයන් සඳහා ඒ උපවගන්තියෙහි සඳහන් ද්‍රව්‍ය හෝ භාණ්ඩ කිසිවක අපනයන වෙළඳාමෙන් ලැබූ ලාභ සහ ආදායම, තක්සේරුව කරන අවස්ථාවේ දී නිශ්චිය වශයෙන් දැනගත නොහැකි විට, තක්සේරුව කරනු ලබන්නේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභ හා ආදායම වශයෙන් කොමසාරිස්වරයා විසින් ඔහුගේ අභිමතය අනුව සාධාරණ යැයි සලකනු ලබන යම් මුදලක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.".

7අ යන අලුත් වගන්තියක් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ ප්‍රඥප්තියෙහි 7අ වන වගන්තිය වශයෙන් එය බල පැවැත් විය යුතු ය :—

'ඇතැම් ව්‍යාපාරවල ලාභ සහ ආදායම නිදහස් කිරීම.

7අ. (1) භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය අපනයනය කිරීමේ හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සේවාවන් සැපයීමේ හැකියාව ඇතැ යි උචිත අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද, ඒ අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, මෙම වගන්තිය අදාළ විය යුතු ව්‍යාපාරයක් වශයෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන්නා වූ ද යම් ව්‍යාපාරයකට මෙම වගන්තිය අදාළ විය යුතු ය.

(2) (අ) මෙම වගන්තිය අදාළ වන ව්‍යාපාරයක් 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු නීතිගත කරනු ලැබූ සමාගමක් විසින් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක—

(i) ඒ ව්‍යාපාරය කලින් පැවති යම් වෙළඳ ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් ඇති කර ගනු ලැබූ ව්‍යාපාරයක් නොවන බවට ද,

(ii) ව්‍යාපාරයෙහි අපනයන පිරිවැටුමේ කිසිම කොටසක් වෙන යම් ව්‍යාපාරයක සම්පූර්ණ වෙළඳාම හෝ ව්‍යාපාර කටයුතු හෝ එහි යම් කොටසක් හෝ ඒ ව්‍යාපාරයෙහි වෙළඳාම හෝ ව්‍යාපාර කටයුතු සමග ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති නොවූ බවට ද

කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ ව්‍යාපාරයෙහි අපනයන ලාභයෙන් හා ආදායමෙන් සමන්විත වන සමාගමේ ලාභ හා ආදායම්වල කොටස ඒ සමාගම නීතිගත කරනු ලැබූ දින සිට ගණින් ගනු ලබන අට අවුරුදු කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(ආ) මේ වගන්තිය අදාළ වන ව්‍යාපාරයක් 1972 අප්‍රේල් 1 වන දිනට පෙර දිනයක එහි වෙළඳාම හෝ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ අවස්ථාවක, ව්‍යාපාරයෙහි අපනයන පිරිවැටුමේ කිසිම කොටසක් වෙන යම් ව්‍යාපාරයක සම්පූර්ණ වෙළඳාම් හෝ ව්‍යාපාර කටයුතු හෝ එහි යම්

කොටසක් එම ව්‍යාපාරයෙහි වෙළඳාම හෝ ව්‍යාපාර කටයුතු සමග ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵල යක් වශයෙන් ඇති නොවූ බවට කොමසාරිස් වරයා සෑහීමට පත් වුවහොත් අදාළ දිනයට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු පහේ එක් එක් වර්ෂය සඳහා ඒ ව්‍යාපාරයෙහි අපනයන ලාභ හා ආදායම අදාළ දිනයට පෙරාතුව වූ අවුරුදු තුනේ අපනයන ලාභ හා ආදායමේ සාමාන්‍යය ඉක්මවා යන ප්‍රමාණය වන ඒ ව්‍යාපාරයෙහි ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(3) මේ වගන්තිය අදාළ වන ව්‍යාපාරයක ගණන් පිළියෙළ කර තිබෙන කාලසීමාවක් නොවන යම් කාලසීමාවක් සඳහා වූ ලාභ හෝ අලාභ, ඒ ගණන් පිළියෙළ කර තිබෙන කාලසීමාව සඳහා ඒ ව්‍යාපාරයෙහි ලාභ හෝ අලාභ සමානුපාත යෙන් එකතු වී ඇත යන පදනම මත නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) (5) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, යම් සමාගමක් ආදායම් බද්දට යටත් නම් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ ව්‍යවස්ථාපිත ආදායම ගණන් බලනු ලබන්නේ හෝ ගණන් බලනු ලැබිය හැක්කේ යම් කාල සීමාවක් ගැන සලකා ද ඒ කාලසීමාව තුළ යම් අවස්ථාවක ඒ සමාගම ලාභාංශයක් ප්‍රකාශ කරතහොත් සහ සම්පූර්ණ ලාභ සහ ආදායම හෝ ඉන් යම් කොටසක් හෝ (2) වන උපවගන්ති යෙහි (අ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කාලසීමාවේ දී ඒ ලාභාංශය ප්‍රකාශයට පත් කරනු ලැබේ නම්, ඒ ලාභාංශය ප්‍රකාශ කර ඇත්තේ යම් ගණන් බලන වර්ෂයක් සඳහා ද ඒ ගණන් බලන වර්ෂයේ මුළු පිරිවැටුම හා ඒ ගණන් බලන වර්ෂයේ අපනයන පිරිවැටුම හා අතර අනුපාතය දළ ලාභාංශය හා ලාභාංශයේ යම් කොටසක් හා අතර ඇති වේ ද ඒ කොටස ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(5) ප්‍රාග්ධනය ආපසු ගෙවීමක් හෝ බෙදා හැරීමක් මේ පනතෙහි කාර්යයන් සඳහා ලාභාංශ යක් ලෙස සලකනු ලැබෙතත් නැතත්, යම් ප්‍රාග්ධනය ආපසු ගෙවීමකට හෝ බෙදා හැරීමකට (4) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා අදාළ දිනය වශයෙන් තෝරා ගනු ලැබූ දිනයක් පසුව වෙනස් නොකරනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුවක් කර ඇත්තේ යම් තක්සේරු කළ හැකි ආදායමක් මත ද ඒ ආදායමට (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ හා ආදායම් කිසිවක් ඇතුළත් අවස්ථාවක, 103 වන වගන්තියෙහි විධිවිධාන කෙසේ වුව ද, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු පහක් ඇතුළත ඒ තැනැත්තා විසින් තක්සේරුකරුවකු වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට සහ ඒ තක්සේරුකරු විසින් ඉල්ලා සිටිය හැකි තොරතුරු මගින් ඒ ඉල්ලීම සනාථ කරනු ලැබූ විට, ඒ ලාභ හා ආදායම අත්හරිමින් ඒ තක්සේරුකරු විසින් සංශෝධිත තක්සේරුවක් කළ හැකි ය ; එවිට, සංශෝධිත තක්සේරුව මගින් අය කරනු ලබන බද්දට වැඩිපුර ගෙවනු ලැබ ඇති යම් මුදලක් 117 වන වගන්තියෙහි අඩංගු කිසිවක් නොතකා ඒ තැනැත්තාහට ආපසු ගෙවිය යුතු ය.

(8) 11 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් ව්‍යාපාරයකින් ලැබෙන යම් තැනැත්තකුගේ ලාභ හා ආදායම නිශ්චිතව දැන ගැනීමේ කාර්යය සඳහා—

(අ) ද්‍රව්‍ය හෝ භාණ්ඩ කිසිවක අපනයන වෙළඳාම සම්බන්ධයෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් හෝ පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රචාරක කටයුතු සඳහා දරනු ලැබූ වියදම ;

(ආ) ද්‍රව්‍ය හෝ භාණ්ඩ කිසිවක අපනයන වෙළඳාම නගාලීම සම්බන්ධයෙන් පමණක් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත සංචාරය කිරීමෙහි ලා දරනු ලැබූ වියදම් විනිමය පාලකගේ අනුමතිය ඇති ව දරන ලද්දේ නම් සහ ඔහු විසින් ඒ සඳහා අවසර දෙන ලද මුදල නො ඉක්මවන්නේ නම් එම වියදම් ; සහ

(ඈ) ශ්‍රී ලංකාවෙහි යම් විද්‍යාත්මක, කාර්මික හෝ කෘෂිකාර්මික පර්යේෂණයක් පවත්වා ගෙන යාමෙහි ලා දරනු ලබන වියදම් පිළිබඳව 10 වන වගන්තිය යටතේ දීමනාවක් නොදෙනු ලැබේ නම් එම වියදම

අඩු කළ යුතු ය.

(9) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා—

"අපනයන ලාභ හා ආදායම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, එම සමාගමේ හෝ ව්‍යාපාරයේ මුළු පිරිවැටුම එම සමාගමේ හෝ ව්‍යාපාරයේ අපනයන පිරිවැටුම හා අතර අනුපාතය මේ පනතෙහි විධිවිධාන අනුව ගණන් බලනු ලබන ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ ( (3) වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ) ලාභ සහ ආදායම හා යම් මුදලක් හා අතර ඇති වේද ඒ මුදල අදහස් වේ;

"අපනයන පිරිවැටුම" යන්නෙන් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා සේවාවන් සැපයීමෙන් යම් සමාගමක් හෝ ව්‍යාපාරයක් විසින් ලබන්නා වූ හෝ ලබා ගත හැකි මුළු මුදල අදහස් වේ; එහෙත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන්නා වූ හෝ ලබා ගත හැකි යම් මුදලක් හෝ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ හා ආදායම නොවන යම් ලාභයක් හා ආදායමක් ඊට ඇතුළත් නොවේ;

"අදාළ දිනය" යන්නෙන්, එය යම් සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, එම සමාගම හෝ එම ව්‍යාපාරය පවත්වා ගෙන යන තැනැත්තා හෝ විසින්, නැතහොත් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට ඒ ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් තෝරා ගනු ලැබූ හා කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් නිවේදනය කරනු ලැබූ, 1965 අප්‍රේල් 1 වන දිනට පෙර නො වන දිනයක් අදහස් වේ;

" මුළු පිරිවැටුම " යන්නෙන් යම් සමාගමක් හෝ ව්‍යාපාරයක් විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් වෙළඳාමකින් හෝ ව්‍යාපාරයකින් ඒ සමාගම හෝ ව්‍යාපාරය විසින් ලබන්නා වූ හෝ ලබා ගත හැකි මුළු මුදල අදහස් වේ ; එහෙත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන්නා වූ හෝ ලබා ගත හැකි යම් මුදලක් හෝ 3 වන වගන්තියෙහි (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ හා ආදායම නොවන යම් ලාභයක් හා ආදායමක් ඊට ඇතුළත් නොවේ.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන 1965 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව—

(අ) ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7අ වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ වූ යම් දැන්වීමක, ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයට පෙර දිනයක්, ඉහත කී 7අ වන වගන්තිය අදාළ වන්නක් ලෙස ව්‍යාපාරයක් ප්‍රකාශයට පත් කරනු ලබන දිනය වශයෙන් නිශ්චිත ව සඳහන් කළ හැකි ය ; තව ද

(ආ) 1967 මාර්තු 31 වන දින පසු නොවී අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ලාභ හා ආදායම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7අ වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කෙරෙන යම් ඉල්ලීමක් 1973 මාර්තු 31 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ හැකි ය.'.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර—

(අ) 1971 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ විට, බද්දට යටත් තමාගේ ලාභ සහ ආදායම් මාර්ග සෑම එකකින්ම යම් තැනැත්තකු ලබන ව්‍යවස්ථාපිත ආදායම, ඒ ලාභ හෝ ආදායම් මාර්ගවල සන්තකය ඔහුට නැතිව ගිය ද නැතහොත් ඒ මාර්ගවලින් ආදායම ඉපදීම නතර වුව ද එය නොතකා, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය තුළ දී ඒ මාර්ගවලින් ඔහු විසින් ලබන ලද්දා වූ හෝ ඔහුගේ ප්‍රයෝජනයට ඇති වූ හෝ ලැබුණා වූ සම්පූර්ණ ලාභ හෝ ආදායම විය යුතු ය ; තව ද

(ආ) 1971 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ විට, බද්දට යටත් තමාගේ ලාභ සහ ආදායම් මාර්ග සෑම එකකින්ම යම් තැනැත්තකු ලබන ව්‍යවස්ථාපිත ආදායම, ඒ ලාභ හෝ ආදායම් මාර්ගවල සන්තකය ඔහුට නැතිව ගිය ද නැතහොත් ඒ මාර්ගවලින් ආදායම ඉපදීම නතර වුව ද එය නොතකා,—

(i) ඒ මාර්ගය සේවා නියුක්තියක් නම් ඒ තක්සේරු වර්ෂය තුළ දී ඒ මාර්ගයෙන් ඔහු විසින් ලබන ලද්දා වූ හෝ ඔහුගේ ප්‍රයෝජනයට ඇති වූ හෝ ලැබුණා වූ සම්පූර්ණ ලාභ හෝ ආදායම විය යුතු ය, තවද

(ii) ඒ මාර්ගය සේවා නියුක්තියක් නොවන වෙනත් මාර්ගයක් නම් ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය තුළ දී ඒ මාර්ගයෙන් ඔහු විසින් ලබන ලද්දා වූ හෝ ඔහුගේ ප්‍රයෝජනයට ඇති වූ හෝ ලැබුණා වූ සම්පූර්ණ ලාභ හෝ ආදායම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

6. 1969 අංක 6 දරන පනතින් ඇතුළත් කරන ලද, ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) 1969 අප්‍රේල් 1 වන දිනයෙහි හෝ ඉන් පසුව, එහෙත් 1973 අප්‍රේල් 1 වන දින ඉකුත් වීමට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයේ දී යම් පුද්ගලයකු අනුමත ආයෝජනයක් කර ඇති හෝ කර ඇතැයි සලකනු ලබන අවස්ථාවක,—

(අ) ඒ ආයෝජනයෙහි නියම ප්‍රමාණයෙන් අඩකට සමාන මුදලක්, හෝ

(ආ) ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් දහයෙන් කොටසක් වන මුදලක්, හෝ

(ඇ) රුපියල් විසිපන් දහසක්

යන මෙයින් අඩුම මුදල කුමක්ද එය ඒ අනුමත ආයෝජනය සම්බන්ධ දීමනාව විය යුතු අතර, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේ දී ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ඒ දීමනාව අඩු කළ යුතු ය :

එසේ වුව ද,—

(අ) 69අ වන වගන්තියෙහි (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි හෝ (ඉ) ඡේදයෙහි නිශ්චිත ව සඳහන් අනුමත ඉතිරි කිරීම කින් 1968 අගෝස්තු 2 වන දිනයෙහි හෝ ඉන් පසුව සහ 1970 අප්‍රේල් 1 වන දිනයට පෙරාතුව

යම් පුද්ගලයකු විසින් අස්කර ගනු ලැබූ හෝ මුදල් කර ගනු ලැබූ යම් ප්‍රමාණයකින් ඒ පුද්ගලයා විසින් කරනු ලැබූ හෝ කර ඇතැයි සලකනු ලබන අනුමත ආයෝජනයකට මෙම උපවගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු අතර, ඒ අනුව ඒ අනුමත ආයෝජනයට අදාළව ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් මේ උපවගන්තිය යටතේ අඩු කිරීමක් නොකළ යුතුය ; නැතහොත්

(ආ) 1973 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේ දී යම් පුද්ගලයකු විසින් කරනු ලබන අනුමත ආයෝජනයක් සම්බන්ධයෙන් 16ඇඇ වන වගන්තිය යටතේ දීමනාවක් කර ඇත්නම් ඒ අනුමත ආයෝජනයට මෙම උපවගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය." ; තව ද

(2) එම වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"1973 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී තක්සේරු කළ හැකි ආදායමෙන් අනුමත ආයෝජන වෙනුවෙන් වූ දීමනා අඩු කළ යුතු බව.".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16ඇ වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය එම ප්‍රඥප්තියෙහි 16ඇඇ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

16ඇඇ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

'1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ව ආරම්භ වන යම් වර්ෂයක බදු අය කළ හැකි ආදයම ගණන් බැලීමේ දී ඒ වර්ෂයේ තක්සේරු කළ හැකි ආදයමෙන් අනුමත ආයෝජන වෙනුවෙන් දීමනා අඩු කළ යුතු බව.

16ඇඇ. (1) මෙම වගන්තියෙහි—

"අනුමත ආයෝජනය" යන්නෙන්—

(අ) සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් 68අ වන වගන්තියේ අර්ථානුකූලව කරන ලද අනුමත ආයෝජනයක් ; හෝ

(ආ) අනුමත ව්‍යාපාරයක වූ ආයෝජනයක් වන එහෙත්—

(i) පවත්නා ආයෝජනයක් මිලට ගැනීමේ කාර්යය සඳහා වූ ආයෝජනයක් නොවන ; හෝ

(ii) සමාගමක සාමාන්‍ය කොටස් නොවන කොටස් මිලට ගැනීමේ කාර්යය සඳහා වූ ආයෝජනයක් නොවන

ආයෝජනයක් අදහස් වේ.

"අනුමත ව්‍යාපාරය" යන්නෙන්, සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ ද, භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය අපනයනය කිරීමේ හෝ විදේශීය මුදල්වලින් ගෙවීම සඳහා සේවාවන් සැපයීමේ හැකියාව ඇතැයි උචිත අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද, ඒ අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යාපාරයක් ලෙස ප්‍රකාශ කරනු ලැබුවා වූ ද ව්‍යාපාරයක් අදහස් වේ.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා භාර්යාවකගේ හෝ දරුවකුගේ තක්සේරු කළ හැකි ආදායමේ මුළු ගණන, ඒ භාර්යාව හෝ දරුවා සාමාජිකයකු වූ පවුලේ ප්‍රධානයාගේ තක්සේරු කළ හැකි ආදායම හා සමග එක් කරනු ලැබූ විට, ඒ භාර්යාව හෝ දරුවා විසින් කරනු ලැබූ යම් අනුමත ආයෝජනයක්, පවුලේ ප්‍රධානයා විසින් කරනු ලැබූ අනුමත ආයෝජනයක් වශයෙන් සැලකිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු අනුමත ආයෝජන දෙකක් හෝ වැඩි ගණනක් කර ඇති හෝ කර ඇතැයි සලකනු ලබන අවස්ථාවක, ඒ ආයෝජනවල මුළු මුදල මෙම වගන්තියෙහි කාර්යයන් සඳහා එක් අනුමත ආයෝජනයක් වශයෙන් සැලකිය යුතු ය.

(4) 1973 අප්‍රේල් 1 වන දිනයෙහි හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයේ දී යම් තැනැත්තකු අනුමත ආයෝජනයක් කර ඇති හෝ කර ඇතැයි සලකනු ලබන අවස්ථාවක—

(අ) ඒ ආයෝජනයෙහි නියම ප්‍රමාණය, හෝ

(ආ) ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් පහෙන් කොටසක් වන ප්‍රමාණයක්

යන මෙයින් අඩු ප්‍රමාණය කුමක් ද එය ඒ අනුමත ආයෝජනය වෙනුවෙන් වූ දීමනාව විය යුතු අතර, ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේ දී ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ඒ දීමනාව අඩු කළ යුතු ය :

එසේ වුව ද, අනුමත ආයෝජනයක් මේ වගන්තියේ අනුමත ආයෝජනය යන්නෙහි අර්ථ නිරූපණයෙහි (අ) ඡේදයෙහි සඳහන් අනුමත මුළු ආයෝජනයෙන්ම හෝ ඉන් කොටසකින් සමන්විත වන විට එම ආයෝජනය හෝ එම ආයෝජනයේ එම කොටස වෙනුවෙන් කරනු ලබන දීමනා 68අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව ගණන් බලනු ලබන අවසර ලත් දීමනාවට වැඩි නො විය යුතු ය:

එසේම තවදුරටත්, 1973 අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පොරතුව වූ වර්ෂයේ දී කරන ලද යම් අනුමත ආයෝජනයක් වෙනුවෙන් 16ඇ වන වගන්තිය යටතේ දීමනාවක් කර තිබේ නම්, ඒ ආයෝජනය සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ දීමනාවක් නොකළ යුතු ය.

(5) අනුමත ආයෝජනයක් වෙනුවෙන් (4) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දීමනාවක් කර ඇති විට සහ ඒ ආයෝජනයෙහි දිනයට පසු පස් අවුරුදු කාලසීමාවක් ඇතුළත ඒ ආයෝජනය කළ පුද්ගලයාගේ මරණය සිදුවීමෙන් හෝ ඒ ආයෝජනය කළ සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසුරුවා හැරීමෙන් හෝ ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසින් පවත්වාගෙන ආ ව්‍යාපාරය නතරවීමෙන් හෝ හැර ඒ ආයෝජනයෙහි අයිතිය වෙනස් වූ විට, ඒ දීමනාව දෙනු ලැබූ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, දීමනාව දී ඇති තැනැත්තාට ඒ දීමනාව නොදෙන ලද්දේ නම් ඔහු යටත්විය හැකි වූ ආදායම් බදු මුදල හා ඒ තක්සේරු වර්ෂය සඳහා අයකර ගනු ලැබූ බදු මුදල හා අතර වෙනසින් සමන්විත වන තක්සේරුවක්, මෙම පනතෙහි සඳහන් කිසිවක් නොතකා, ඒ තැනැත්තා සම්බන්ධයෙන් කළ යුතු අතර තක්සේරු දැන්වීම, අභියාචනය හා වෙනත් කෘත්‍යයන් සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන ඒ අතිරේක තක්සේරුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.'.

8. 1971 අංක 33 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය එම වගන්තියේ (1අ) සහ (1ආ) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන්

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ වීමේ දී—

(අ) 1965 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඉන් ඉක්බිතිවම එන තක්සේරු වර්ෂ හතර සම්බන්ධයෙන්—

(i) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "සියයට 57" යන යෙදුම වෙනුවට "සියයට 50" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන්, සහ

(ii) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "සියයට 28½" යන යෙදුම යෙදෙන කවර තැනක වුව ද ඒ වෙනුවට "සියයට 25" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන් ද, එසේම

(ආ) 1970 අප්‍රේල් 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්—

(i) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "සියයට 57" යන යෙදුම වෙනුවට "සියයට 60" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන්, සහ

(ii) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "සියයට 28½" යන යෙදුම යෙදෙන කවර තැනක වුව ද ඒ වෙනුවට "සියයට 35" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන් ද

ඒ උපවගන්තිය බලපැවැත්විය යුතු අතර එය එසේ බලපැවැත් වූ ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. 1971 අංක 33 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1අ) සහ (1ආ) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමේ දී—

(අ) 1965 අප්‍රේල් 1 වන දිනයෙන් අරම්භ වන තක්සේරු වර්ෂය සහ ඉන් ඉක්බිතිවම එන තක්සේරු වර්ෂ හතර සම්බන්ධයෙන් ඒ උපවගන්තියේ "සියයට 57" යන යෙදුම යෙදෙන කවර තැනක වුව ද ඒ වෙනුවට "සියයට 50" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන්, සහ

(ආ) 1970 අප්‍රේල් 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධ

යෙන් ඒ උපවගන්තියේ "සියයට 57" යන යෙදුම යෙදෙන කවර තැනක වුව ද ඒ වෙනුවට "සියයට 60" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන් ද

ඒ උපවගන්තිය බලපැවැත්විය යුතු අතර එය එසේ බලපැවැත් වූ ලෙස සැලකිය යුතු ය. තව ද

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) යම් තක්සේරු වර්ෂයක් තුළ යම් නිර්වාසික සමාගමකට ගෙවිය යුතු වන යම් ලාභාංශ මුදලකින්, සෑම නේවාසික සමාගමක් ම විසින්,—

(අ) ඒ ලාභාංශය ඒ නේවාසික සමාගම වෙනත් නේවාසික සමාගමකින් ලැබුවා වූ ද 5අ වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 7අ වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් ලාභාංශයක යම් කොටසක් නො වන්නා වූ ද ලාභාංශයක යම් කොටසකින් සමන්විත වන්නේ නම්, සියයට පනහකින් වැඩි කළ පළමුව සඳහන් ලාභාංශයෙන් සියයට හයකට සමාන ආදායම් බද්දක් ;

(ආ) පළමුව සඳහන් ලාභාංශය ඒ නේවාසික සමාගම විසින් වෙනත් නේවාසික සමාගමකින් ලබන ලද ලාභාංශයක යම් කොටසකින් සමන්විත නො වේ නම්, ඒ පළමු සඳහන් ලාභාංශයෙන් සියයට හයකට සමාන ආදායම් බද්දක් ; සහ

(ඇ) ඒ පළමු සඳහන් ලාභාංශය 5අ වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 7අ වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ලාභාංශයකින් ගෙවා ඒ නේවාසික සමාගමට ලැබුණේ නම්, ඒ පළමු සඳහන් ලාභාංශයෙන් සියයට හයකට සමාන ආදායම් බද්දක්

අඩු කර ගත යුතු ය. තව ද

නේවාසික සමාගමකට මේ වගන්තිය යටතේ අඩු කිරීමට නියම වූ ආදායම් බද්ද නේවාසික සමාගමෙන් ජනරජයට අය විය යුතු ණයක් විය යුතු ය. තව ද ඒ ණය වශයෙන් එය වහාම අය කර ගත යුතු ය ; නැතහොත් ඒ සමාගම විසින් අන් ආකාරයකින් ගෙවිය යුතු යම් ආදායම් බද්දකට අතිරේකව තක්සේරු කරනු ලැබිය හැකි අතර ඒ මුදල ඒ සමාගමට වැයබර කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** 1965 අංක 18 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ඒ වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(4) යම් තක්සේරු වර්ෂයක් තුළ දී නේවාසික සමාගමක් විසින් ගෙවිය යුතු වන යම් ලාභාංශයක් ගෙවීම සඳහා ලියනු ලැබූ හෝ පිළියෙළ කරනු ලැබූ බලපත්‍රයක්, චෙක් පතක් හෝ වෙනත් අණක් නිකුත් කරන සෑම තැනැත්තකුම විසින් මෙයි පහත දැක්වෙන කරුණු පෙන්නුම් කරන ලිඛිත ප්‍රකාශයක් එයට ඇමිණිය යුතු ය. එනම්:—

(අ) ආදායම් බදු අඩු කිරීමෙන් පසු නියම වශයෙන් ගෙවනු ලැබූ ශුද්ධ මුදලට අනුරූප වන දළ ප්‍රමාණය ;

(ආ) ආදායම් බදු වශයෙන් අඩු කරනු ලැබූ ප්‍රමාණය ;

(ඇ) නියම වශයෙන් ම ගෙවනු ලැබූ ශුද්ධ ප්‍රමාණය ;

(ඈ) එවැනි යම් ලාභාංශයකට, ඒ සමාගම විසින් වෙනත් යම් නේවාසික සමාගමකින් ලබා ගත් ලාභාංශයක් ඇතුළත් වන විට, එසේ ලැබුණු ලාභාංශයේ කොටස සහ—

(i) ඒ ලාභාංශය 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද යන වග ; හෝ

(ii) ඒ ලාභාංශය සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් 5අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හෝ 7අ වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද යන වග ; සහ

(ඉ) එවැනි යම් ලාභාංශයකට, ඒ සමාගම විසින් 25 වන වගන්තියේ (2අ) වන උපවගන්තියේ සඳහන් යම් නිර්වාසික සමාගමකින් ලබා ගත් ලාභාංශයක යම් කොටසක් ඇතුළත් වන විට, එසේ ලැබුණු ලාභාංශයේ කොටස.

(5) වෙන යම් නේවාසික සමාගමකින් හෝ 25 වන වගන්තියේ (2අ) වන උපවගන්තියේ සඳහන් යම් නිර්වාසික සමාගමකින් හෝ ලැබුණු යම් ලාභාංශයක ප්‍රමාණය ඇතුළත් වූ ලාභාංශයක් නේවාසික සමාගමක කොටස්කරුවකුට ලැබුණු බව (4) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශයෙන් අනාවරණය වන විටක, ඒ කොටස්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා එම ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන මුදලක් ඔහු විසින් ගෙවිය යුතු බද්දට හිලව් කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන—

(අ) ඒ කොටස්කරු සමාගමක් වන අවස්ථාවක දී, ඒ කොටස්කරුට සහ ඒ කොටස්කරු සම්බන්ධයෙන් ; හෝ

(ආ) වෙන යම් සමාගමකින් ලැබුණු ලාභාංශයක් 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර ආදායම් බද්දෙන් නිදහස් කර ඇති විටක හෝ 5අ වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 7අ වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ ප්‍රකාර ඒ ලාභාංශය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කර ඇති විටක ඒ ලාභාංශයට හෝ ඒ සම්බන්ධයෙන්

ආදාළ නොවිය යුතුය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"1972 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ධන බද්ද, තක්සේරු කළ හැකි ආදායමින් සියයට අසූවක් නො ඉක්මවිය යුතු බව.

38. 1972 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ධන බද්ද ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමින් සියයට අසූවකට වැඩි නො විය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ස්වාමි පුරුෂයාගේ සහ භාර්යාවගේ ආදායම වෙන් වෙන් වශයෙන් තක්සේරු කිරීම.

45. (1) මේ පනතේ ඉහත සඳහන් විධිවිධානවල කුමක් ඇතුළත් වුව ද 1971 අප්‍රේල් 1 වන දින පසු නො වී ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ස්වාමිපුරුෂයා හා භාර්යාව විවාහ නොවූවන් පරිද්දෙන් සලකා ස්වාමිපුරුෂයාගේ ආදායම හෝ ශුද්ධ ධනය මත සහ භායණිවගේ ආදායම සහ ශුද්ධ ධනය මත වෙන් වෙන් වශයෙන් ඒ වර්ෂයේ ආදායම් බද්ද සහ ධන බද්ද තක්සේරු කර, පනවා අය කර ගන්නා ලෙස ඉල්ලන ලිඛිත දැන්වීමක් ඒ තක්සේරු වර්ෂයේ ජූනි මස පළමුවන දිනට පෙර හෝ එවැනි යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් තක්සේරුවක් කිරීමට පෙර කවර විටෙක වුව ද යම් ස්වාමිපුරුෂයකු හෝ භායණිවක විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඉන් පසු මේ පනතේ සියලු විධිවිධාන ඒ අනුව ඔවුන් එකිනෙකාට අදාළ විය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවට පැමිණීමට පෙරාතුවම ශ්‍රී ලංකාවේ නේවාසිකව නොසිටි තැනැත්තකු

සම්බන්ධයෙන් වූ විට ඔහු ශ්‍රී ලංකාවට පැමිණි පසු එළඹෙන දොළොස් මාසයේ කාලසීමාව තුළ ඉදිරිපත් කරනු ලැබූ දැන්වීමක් මේ උපවගන්තියේ කාර්යයන් සඳහා බලපවත්වනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ ඉහත සඳහන් විධිවිධානවල කුමක් ඇතුළත් වුව ද 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ස්වාමිපුරුෂයකු හෝ භාර්යාවක විසින් ගෙවිය යුතු පළමු වන ත්‍රෛමාසික වාරිකය ඔහු හෝ ඇය විසින් ගෙවනු ලබන අවස්ථාවේ දී, ඔහු හෝ ඇය විවාහ නොවූවත් පරිද්දෙන් ඔහුගේ හෝ ඇගේ ආදායමෙන් හෝ ශුද්ධ ධනයෙන් ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද වෙන් වෙන් වශයෙන් ගෙවීමට අපේක්ෂා කරන බවට ලිඛිත දැන්වීමක්, අවස්ථාවෝචිත පරිදි, ඔහු හෝ ඇය විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, එවැනි දැන්වීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන ඔවුන් එකිනෙකාට එපරිද්දෙන් අදාළ විය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති කල්හි—

(අ) එවැනි දැන්වීමක් ඉදිරිපත් කරනු නොලැබී නම් තමා විසින් සැපයීමට තිබුණු වාර්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ස්වාමිපුරුෂයා විසින් සැපයිය යුතු ය; තව ද

(ආ) භාර්යාව පවුලක ප්‍රධානියාව සිටියා නම් සහ ඇගේ ස්වාමිපුරුෂයා සහ ඔවුන් දෙදෙනාගෙන් කවරකුගේ හෝ යම් දරුවකු නැත හොත් යැපෙන ඥාතියකු ඒ පවුලේ සාමාජිකයකුව සිටියේ නම් ඇය විසින් සැපයීමට තිබුණු වාර්තා ඒ තක්සේරු වර්ෂය සඳහා භාර්යාව විසින් සැපයිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ ඉදිරිපත් කරන ලද දැන්වීමක ප්‍රතිඵලයක් වශයෙන් ස්වාමිපුරුෂයාගේ ආදායම සහ භාර්යාවගේ ආදායම මත වෙන් වෙන් වශයෙන් ආදායම් බද්ද තක්සේරු කර ඇති විට, ස්වාමිපුරුෂයාගේ සහ භාර්යාවගේ ආදාය මත්, ස්වාමිපුරුෂයා සහ භාර්යාව විසින් සපයන

ලද වාර්තා අනුව ඔවුන් දෙදෙනාගෙන් එක් අයකුගේ හෝ දෙදෙනාගේම හෝ දරුවකු නැතහොත් යැපෙන ඥාතියකු වන යම් තැනැත්තකුගේ ආදායමත් එකට එකතු කළ යුතු අතර, ඒ දැන්වීම ඉදිරිපත් නො කරන ලද නම් ස්වාමිපුරුෂයා විසින් ගෙවනු ලැබිය යුතු වූ ආදායම් බද්ද මේ පනතේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය. එසේ නිශ්චය කරනු ලැබූ ආදායම් බදු ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් ස්වාමිපුරුෂයාගේ සහ භාර්යාවගේ තක්සේරු කළ හැකි ආදායම හා ඒ දෙදෙනාගේ ම තක්සේරු කළ හැකි ආදායම්වල එකතුව හා අතර ඇති අනුපාතය අනුව ඔවුන් එකිනෙකා අතර බෙදී යා යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ ඉදිරිපත් කරන ලද දැන්වීමක ප්‍රතිඵලයක් වශයෙන් ස්වාමිපුරුෂයාගේ ශුද්ධ ධනය සහ භාර්යාවගේ ශුද්ධ ධනය මත වෙන් වෙන් වශයෙන් ධන බද්ද තක්සේරු කර ඇති අවස්ථාවක දී ස්වාමිපුරුෂයාගේ ශුද්ධ ධනයේ වටිනාකමත් භාර්යාවගේ ශුද්ධ ධනයේ වටිනාකම සහ ස්වාමිපුරුෂයා සහ භාර්යාව විසින් ශුද්ධ ධනය පිළිබඳ ව සපයන ලද වාර්තා අනුව ඒ දෙදෙනාගේම හෝ ඔවුන්ගෙන් එක් කෙනකුගේ දරුවකු නැතහොත් යැපෙන ඥාතියකු වන යම් පුද්ගලයකුගේ ශුද්ධ ධනයේ වටිනාකම එකට එකතු කළ යුතු අතර, ඒ දැන්වීම ඉදිරිපත් නො කරන ලද නම් ස්වාමිපුරුෂයා විසින් ගෙවිය යුතු ධන බද්ද මේ පනතේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය. එසේ නිශ්චය කරනු ලැබූ ධන බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ස්වාමිපුරුෂයාගේ සහ භාර්යාවගේ ශුද්ධ ධනයේ වටිනාකම හා ඒ දෙදෙනාගේම ශුද්ධ ධනයේ වටිනාකමේ එකතුව හා අතර ඇති අනුපාතය අනුව ඔවුන් දෙදෙනා අතර බෙදී යා යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක ප්‍රතිඵලයක් වශයෙන් ස්වාමිපුරුෂයකු සහ භාර්යාවක සම්බන්ධයෙන් ධන බද්ද සහ ආදායම් බද්ද වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ඇත්තා වූ ද ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් ගෙවිය යුතු ආදායම් බද්දේ සහ ධන බද්දේ එකතුව ඒ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ තක්සේරු කළ හැකි ආදායමින් සියයට අසූවකට වැඩි වන්නා වූ ද අවස්ථාවක, 105 වන වගන්තිය යටතේ ධන බද්දට හිලව් කරනු ලබන ප්‍රමාණය, ඒ දැන්වීම ඉදිරිපත් නොකරන ලද නම් ඒ ස්වාමි

පුරුෂයා විසින් ගෙවනු ලැබිය හැකිව තිබුණු ධන බද්දට හිලව් කරනු ලැබිය හැකිව තිබුණු ප්‍රමාණයට වැඩි නො විය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක ප්‍රතිඵලයක් වශයෙන් ස්වාමිපුරුෂයකු සහ භාර්යාවක සම්බන්ධයෙන් ආදායම් බද්ද සහ ධන බද්ද වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ඇත්තාවූ ද ස්වාමිපුරුෂයා සහ භාර්යාව විසින් ගෙවිය යුතු ආදායම් බද්දේ හෝ ධන බද්දේ එකතුව ඒ දැන්වීම ඉදිරිපත් නොකරන ලද නම් ඒ ස්වාමිපුරුෂයා විසින් ගෙවනු ලැබිය යුතුව තිබුණු ආදායම් බදු හෝ ධන බදු හෝ ආදායම් බදු සහ ධන බදු ප්‍රමාණයට අඩු වන්නා වූ ද අවස්ථාවක, ඒ ඌනතාවේ ප්‍රමාණය, ඒ එක් එක් තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම හෝ ශුද්ධ ධනය හා ඔවුන් දෙදෙනාගේ ම තක්සේරු කළ හැකි ආදායමේ හෝ ශුද්ධ ධනයේ එකතුව හා අතර ඇති අනුපාතය අනුව ඒ ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර බෙදිය යුතු ය.

(8) ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාගෙන් එක් තැනැත්තකු නේවාසික වන්නා වූ ද අනෙක් තැනැත්තා නිර්වාසික වන්නා වූ ද ඒ නේවාසික තැනැත්තා විසින් (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ දැන්වීමක් ඉදිරිපත් කර ඇත්තා වූ ද අවස්ථාවක, (4) වන උපවගන්තියේ නැතහොත් (5) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බව නේවාසික තැනැත්තා විසින් ඒ දැන්වීම මගින් තෝරා ගනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී, නේවාසික නොවන තැනැත්තාට සහ ඔවුන් දෙදෙනාගේම හෝ ඔවුන්ගෙන් කෙනකුගේ හෝ දරුවකු නැතහොත් යැපෙන ඥාතියකු වූ ද නිර්වාසික වූ ද යම් පුද්ගලයකුට, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවෙන් ලැබෙන ආදායම හෝ ඒ අයගේ ශුද්ධ ධනයේ වටිනාකම, (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ හෝ විධිවිධාන නොතකා, ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනා අතුරෙන් නේවාසික තැනැත්තාගේ ආදායම හෝ බදු අය කළ හැකි ධනයේ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතුය. තව ද නේවාසිකව සිටින ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණන් බැලීමේ දී ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතුරෙන් නිර්වාසික තැනැත්තා සහ ඉහත කී යම් පුද්ගලයකු නේවාසික ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ පවුලේ සාමාජිකයෙකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(9) ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනා අතුරෙන් එක් තැනැත්තකු නේවාසිකව සිටින්නා වූ ද අනෙක් තැනැත්තා නිර්වාසිකව සිටින්නා වූ ද අවස්ථාවක, මේ පනතේ සියලු කාර්යයන් සඳහා, නේවාසික තැනැත්තා නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා ලෙස සලකනු ලැබිය හැකි අතර, හවුලේ හෝ තනි තනි ව තක්සේරු කරනු ලැබුයේ වුව ද දෙදෙනාගේ ම ලාභ සහ ආදායම හෝ ශුද්ධ ධනය හෝ සම්බන්ධයෙන් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද ගෙවීමට යටත් විය යුතු ය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

("භාරගන්නන් සහ භාරකරුවන් විසින් වාර්තා සැපයිය යුතු බව සහ ඔවුන්ගෙන් බදු අය කර ගත හැකි බව.)

**47.** (1) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත පහත සඳහන් දේ සපයන ලෙස භාරගන්නකුට හෝ භාරකරුවකුට නියම කරමින් ලිඛිත දැන්වීමක් තක්සේරුකරුවකු විසින් භාරගන්නකු හෝ භාරකරුවකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය:—

(අ) භාරගන්නකු සම්බන්ධයෙන් වූ විට—

(i) ආදායම් බදු කාර්යයන් සඳහා, ඔහුගේ පාලනය යටතේ ඇති දේපළ වලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක්, හෝ

(ii) ධන බදු කාර්යයන් සඳහා, ඒ දේපළ පිළිබඳ වාර්තාවක් සහ ඔහු විසින් යම් දේපළ කිසි යම් තැනැත්තන් අතර බෙදා දී තිබේ නම් ඒ දේපළ පිළිබඳ විස්තරයක් හා ඒ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) භාරකරුවකු සම්බන්ධයෙන් වූ විට—

(i) ආදායම් බදු කාර්යයන් සඳහා, භාරයට යටත් දේපළවලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක්, හෝ

(ii) ඒ දේපළ පිළිබඳ වාර්තාවක් සහ භාරයට යටත් අර්ථලාභීන්ගේ නම් හා ලිපිනයන් සහ භාරය යටතේ ඔවුන්ට හිමිකම් ලැබී ඇති අර්ථලාභ පිළිබඳ වාර්තාවක්,

තව ද

(i) ඔහු භාරගන්නකු නම් ඔහුගේ පාලන යට යටත් දේපළවල ආදායමින් හෝ දේපළවල ධනයෙන්, සහ

(ii) ඔහු භාරකරුවකු නම්, මේ වගන්ති යෙහි (2) වන උපවගන්තියේ සහ 30 වන වගන්තියෙහි (1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ භාරයේ දේපළවල ආදාය මින් හෝ එහි දේපළවල ධනයෙන්

ආදායම් බද්ද හෝ ධන බද්ද ඒ භාර ගන්නාගෙන් හෝ භාරකරුගෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දට යටත් වන ආදායමක් උපදින යම් භාරය කින් අර්ථලාභ ලබන යම් අර්ථලාභීන් සිටින විට ඒ අර්ථලාභීන්ට හිමිකම ඇති ඒ ආදායමේ කොටස (1) වන උපවගන්තිය යටතේ බද්දට යටත් ආද යම් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු අතර මේ පනතේ කාර්යයන් සඳහා ඒ ආදායමේ කොටස ඒ අර්ථලාභීන්ගේ ආදායම වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව, ඒ එක් එක් අර්ථලාභියා ඒ ආදායමේ තම කොටස සම්බන්ධයෙන් ආදායම් බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

(3) 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් භාරයක සම්පූර්ණ ආදායම හෝ ඒ ආදායමින් කොටසක් අර්ථලාභියකුගේ ආදායම ලෙස (2) වන උපවගන්තිය යටතේ සලකනු ලබන විට හෝ භාරයකට යටත් දේපළක් සම්පූර්ණයෙන්ම හෝ ඒ දේපළින් කොටසක් 30 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ ඒ භාරයට යටත් අර්ථ ලාභියකුගේ ධනයට ඇතුළත් කර ඇති විට, භාර කරු විසින්—

(අ) 1972 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ විට 1972 දෙසැම්බර් 20 වන දින හෝ ඊට පෙර; සහ

(ආ) අන් කවර හෝ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට ඒ තක්සේරු වර්ෂයේ ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් සහ මාර්තු යන මාසවල පසළොස් වැනි දින හෝ ඊට පෙර

කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් වූ ද ඒ ආදායමේ හෝ ධනයේ ප්‍රමාණය සඳහන් කළා වූ ද දැන්වීමක් ඒ අර්ථලාභියාට භාර දිය යුතු ය.

(4) භාරයක අර්ථලාභියකුට ඒ භාරයෙන් හිමි වන ආදායම හෝ ශුද්ධ ධනය සම්බන්ධයෙන් ඔහුගෙන් අය කර ගත යුතු ආදායම් බද්ද හෝ ධන බද්ද හෝ ඉන් යම් කොටසක්, භාරකරු විෂයෙහි තක්සේරුවක් කර නො තිබීම ගැන නො තකා, ඒ භාරයේ ඒ භාරකරුගෙන් අය කර ගනු ලැබිය හැකි අතර බදු එකතු කිරීමට සහ අය කර ගැනීමට අදාළ වූ මේ පනතේ විධිවිධාන ඒ භාර කරුට අදාළ විය යුතු ය. භාරයෙන් ඒ අර්ථලාභියාට ගෙවිය යුතු වන ආදායමෙන් ඒ බදු ප්‍රමාණය හෝ එහි කොටස අඩු කර ගැනීමට ඒ භාරකරුට හිමි කම තිබිය යුතු ය.

(5) 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා භාර ගන්නකුගෙන් හෝ භාරකරුවකුගෙන් මේ පනත යටතේ අය කර ගනු ලැබිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද ඔහු විෂයෙහි තක්සේරුවක් කර නො තිබීම ගැන නො තකා, 96ආ වන වගන්තියේ විධි විධාන ප්‍රකාර ඔහු විසින් ගෙවනු ලැබිය යුතුය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) මිය ගිය තැනැත්තකුගේ බූදලයෙන් ලැබෙන ආදායමෙහි අර්ථලාභියකු සතු කොටස සම්බන්ධයෙන් හෝ එකී බූදලයෙන් ඔහුට අයිතිවාසිකම ඇති ශුද්ධ ධන කොටස සම්බන්ධයෙන් හෝ ඒ අර්ථලාභියාගෙන්, 1972 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පසු හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දක් හෝ ධන බද්දක් අය කරනු ලැබිය යුතු අවස්ථාවක දී, එම බූදලයේ බූදල් බලකරු විසින්—

(අ) 1972 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ විට, 1972 දෙසැම්බර් 20 වන දින හෝ ඒ දිනයට පෙර ද,

(ආ) වෙන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට, ඒ තක්සේරු වර්ෂයේ ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් සහ මාර්තු යන මාසවල පසළොස් වැනි දින හෝ ඒ දිනයට පෙර ද

එම ආදායමේ හෝ ශුද්ධ ධනයේ ප්‍රමාණය සඳහන් කර ඇත්තා වූ ද කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක වූ ද දැන්වීමක් අර්ථලාභියාට දිය යුතු අතර ඒ ආකෘතියේ සඳහන් කිරීමට නියමිත විස්තර ඒ දැන්වීමෙහි ඇතුළත් විය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) මිය ගිය තැනැත්තකුගේ බූදලයෙන් අර්ථලාභියකුට අයිතිවාසිකම ඇති ආදායම හෝ ශුද්ධ ධනය හෝ නිශ්චය කරනු ලැබිය නො හැකි අවස්ථාවක දී, එම ආදායම හෝ ශුද්ධ ධනය හෝ සම්බන්ධයෙන් බූදල් බලකරුගෙන් ආදායම් බදු හෝ ධන බදු හෝ අය කරනු ලැබිය යුතු ය."; තවද

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5) 1972 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ බූදල් බලකරුවකුගෙන් අය කරනු ලබන ආදායම් බදු සහ ධන බදු ඔහු සම්බන්ධයෙන් තක්සේරුවක් කරනු නොලැබ තුබුණ ද, ඔහු විසින් 96අ වන වගන්තියේ විධිවිධාන අනුව ගෙවිය යුතු ය.".

52අ යන අලුත් වගන්තියක් ප්‍රධාන ප්‍රඥප්ති යෙහි ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි 52අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

'1972 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායමෙන් හවුල්කරුවන්ට ලැබිය යුතු කොටස් ගැන ප්‍රමුඛ හවුල්කරු විසින් ඒ හවුල්කරුවන්ට දන්විය යුතු බව.

52අ. (1) 1972 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තම ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කර ගැනීමට හවුල්කරුවකුට අවස්ථාවක් සැලසීමේ කාර්යය සඳහා හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ, සක්‍රිය හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ පදිංචි වී නො සිටින අවස්ථාවක දී, හවුල් ව්‍යාපාරයෙහි ශ්‍රී ලංකාවෙහි සිටින අනුයෝජිතයා විසින් හෝ—

(අ) 1972 අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට, 1972 දෙසැම්බර් 20 වන දින හෝ එදිනට පෙර ද,

(ආ) වෙන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට, එම තක්සේරු වර්ෂයේ ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් සහ මාර්තු යන මාසවල පහළොස් වැනි දින හෝ ඒ දිනයට පෙර ද

එම තක්සේරු වර්ෂයට පෙරතුවම වූ දොළොස් මාසය සඳහා හෝ 12 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ආදායම ගණන් බැලිය හැක්කේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය හෝ පාඩුව අතුරින් සහ වෙනත් ආදායම් අතුරින් එක් එක් හවුල්කරුට හිමි කොටස සඳහන් කර ඇත්තා

වූ ද කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක වූ ද දන්වීමක් ඒ එක් එක් හවුල්කරුට දිය යුතු ය.

(2) 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාර යක බෙදිය හැකි ලාභය හෝ පාඩුව විය යුත්තේ, (ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින වෙනත් තැනැත් තකුට ගෙවිය යුතු වන අවස්ථාවක දී හැර) ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු යම් පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ නිෂ්පාදන භාග යක්, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ දොළොස් මාසයේ කාලසීමාව තුළ දී හෝ ඒ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායම 12 වන වගන්තිය යටතේ ගණන් බලනු ලැබිය හැකි වෙන යම් කාල සීමාවක් තුළ දී යම් වෙළඳා මකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රැකියාව කින් හෝ සේවා නියුක්තියකින් ඒ හවුල් ව්‍යාපාරය ලබන සම්පූර්ණ ලාභවලින් අඩු කිරීමෙන් පසු නැතහොත් අවස්ථාවෝචිත පරිදි එහි මුළු පාඩුවට එකතු කිරීමෙන් පසු, යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමට අදාළ මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණන් බලනු ලබන එකී ලාභ හෝ පාඩු විය යුතු ය. ".

**16.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 53ආ වන වගන්තියෙන් පසුව ඇති "ඇඇඇ—අපනයනය කිරීම සඳහා නිෂ්පාදනය කිරීම" යන ශීර්ෂය මෙයින් අස් කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 53ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 53ආ වන වගන්තියෙන් පසුව ඇති ශීර්ෂය ඉවත් කිරීම සහ ඒ ප්‍රඥප්තියේ 53ඇ වන වගන්තිය ඉවත් කිරීම.**

**17.** 1968 අංක 26 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි අන්තර් ගත කොට ඇති 68අ වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**ප්‍රධාන ප්‍රඥප්තියේ 68අ වන වගන්තිය සංශෝධනය කිරීම.**

" (4) සමාගමක් විසින් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ 1967 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පසුව එහෙත් 1972 අප්‍රේල් 1 වන දින පසු නොවී ඇරඹිය වන යම් තක්සේරු වර්ෂය කට පෙරාතුව වූ වර්ෂය තුළ අනුමත ආයෝජනයක් කරන ලද අවස්ථාවක දී, ඒ ආයෝජනය සම්බන්ධයෙන් අවසර දෙනු ලැබූ

දීමනාව ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිණි නම් බද්ද වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණයකට ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතු බද්ද අඩුකර දෙන අන්දමේ ආදායම් බදු සහනයකට ඒ ආයෝජනය හේතුකොටගෙන ඒ සමාගමට හෝ පුද්ගල මණ්ඩලයට හෝ අයිති වාසිකම තිබිය යුතු ය:

එසේ වුව ද, ඒ ආයෝජනය හේතුකොටගෙන ලැබෙන ඒ බදු සහනය එකී අවසර දුන් දීමනාවෙන් එක් අඩක් නොඉක්මවිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. 1971 අංක 31 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) 1971 අප්‍රේල් 1 වන දින සිට හෝ එදිනට පෙර හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තනි පුද්ගලයකු වශයෙන් හෝ පවුලක ප්‍රධානියා වශයෙන් හෝ ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු අය කරනු ලැබීමට යටත් යම් තැනැත්තකු විසින් 82 වන වගන්තිය යටතේ එම වර්ෂය සඳහා ආදායම, ධනය හෝ තෑගි පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු යයි තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබ නොමැති නම්, තමා එසේ බදු අය කරනු ලැබීමට යටත් බවට ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ වර්ෂය ආරම්භ වන දිනට පසු තෙමසක කාලසීමාව ඇතුළත කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය:

එසේ වුව ද, 1971 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා එකී දැන්වීම එම තක්සේරු වර්ෂය ආරම්භ වීමෙන් පසු මාස නවයක කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය."; තවද

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

82අ යන අලුත් වගන්තියක් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 82 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 82අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

" ගිණුම් ප්‍රකාශවලට සහ විගණන සහතිකවලට අදාළ විධිවිධාන.

82අ. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා පහත සඳහන් දේවල් සපයන ලෙස දන්වමින් තක්සේරු කරුවකු විසින් යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුට හෝ වෙන යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් කරනු ලැබිය හැකි ය:—

(අ) එම තක්සේරු වර්ෂයට පෙරාතුව වර්ෂය සඳහා හෝ එම තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම ගණන් බලනු

ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධ යෙන් ද ඒ කාලසීමාව සඳහා හෝ, ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව පිළිබඳ වූ අනුමත ගණකාධිකාරි වරයකු විසින් විගණනය කරනු ලැබූ ගිණුම් ප්‍රකාශයක්, සහ

(ආ) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයක වූ ද එකී අනුමත ගණකාධිකාරිවරයා විසින් පිළියෙළ කරනු ලැබුවා වූ ද විගණන වාර්තාවක්.

(2) පහත සඳහන් කටයුතු කරන ලෙස, කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන වර්ගයක හෝ විස්තරයක හෝ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් හෝ කරන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුට හෝ වෙන යම් තැනැත්තකුට හෝ කලින් කල නියම කරනු ලැබිය හැකි ය :—

(අ) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ගිණුම් පොත් පවත්වා ගෙන යාම,

(ආ) එම දැන්වීමේ සඳහන් කරනු ලබන ආකාරයෙන් එම වෙළඳාම හෝ ව්‍යාපාරය හෝ සම්බන්ධ ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම, සහ

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා, එකී දැන්වීමේ සඳහන් කරනු ලබන ආකාර යෙන් වූ සහ අනුමත ගණකාධිකාරිවරයකු විසින් පිළියෙළ කරනු ලැබුවා වූ විගණන වාර්තාවක් ද සමඟ, එම වෙළඳාම හෝ ව්‍යාපාරය හෝ පිළිබඳ ලාභ සහ ආදායම ද වත්කම් සහ බැරකම් ද දක්වන්නා වූ සහ අනුමත ගණකාධිකාරි වරයකු විසින් විගණනය කරනු ලැබුවා වූ ප්‍රකාශයක් සැපයීම.

(3) මේ පනතේ කාර්යයන් සඳහා යම් තැනැත්තකු විසින් සපයන ලද ආදායම පිළිබඳ වාර්තාවක් සනාථ කරමින් අනුමත ගණකාධිකාරි වරයකු විසින් ගිණුම් ප්‍රකාශයක් පිළියෙළ කරන ලද අවස්ථාවක, ඒ ප්‍රකාශය සමඟ ඒ අනුමත ගණකාධිකාරිවරයාගේ සහතිකයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ සහතිකය කොමසාරිස් වරයා විසින් නියම කරනු ලබන ආකාරයකින් විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යයන් සඳහා "අනුමත ගණකාධිකාරිවරයා" යන්නෙන්—

(අ) ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරිවරයෙක්;

(ආ) මේ පනතේ කාර්යයන් සඳහා "බලයලත් නියෝජිතයකු" වශයෙන් කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරිවරයෙක්; හෝ

(ඇ) සමාගම් (විගණකවරුන්ගේ) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවා වූ ද මේ පනතේ කාර්යයන් සඳහා බලයලත් නියෝජිතයකු වශයෙන් කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද යම් පුද්ගලයෙක්

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 93 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) 1971 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පෙර හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුකරුවකුගේ මතය අනුව ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු අය කර ගනු ලැබීමට යටත් වන සෑම තැනැත්තකුටම 82 වන වගන්තිය යටතේ ආදායම, ධනය හෝ තෑගි පිළිබඳ වාර්තාවක් සපයන ලෙස නියම කරමින් කරනු ලබන දැන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඉකුත් වීමෙන් පසුව හැකි ඉක්මණින් එම තක්සේරුකරු විසින් ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතු ය."; නවද

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිටව යාමට ආසන්නව ඇතැයි හෝ වෙන යම් හේතුවක් නිසා හදිසියේ තක්සේරු කිරීම අවශ්‍ය යැයි තක්සේරුකරුවකු අදහස් කරතහොත්, (1) වන උපවගන්තියෙහි කුමක් ඇත ද එය නොතකා, 1972 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසු හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, කවර විටෙක වුව ද, ඒ අවස්ථාව තක්සේරුව අදාළ වන තක්සේරු වර්ෂයට කලින් දිනයක් වුවත් නොවුවත්, ඒ තක්සේරුකරු විසින් ඒ තැනැත්තා තක්සේරු කළ හැකි ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ XIඅ වන පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි XIඅ වන පරිච්ඡේදය ඇතුළත් කිරීම.

'XIඅ වන පරිච්ඡේදය

ලාභ සහ ආදායම්, ශුද්ධ ධනය සහ බද්දට යටත් තෑගි ස්වයං තක්සේරු කිරීම සහ ඒ අනුව අය විය යුතු බද්ද ගෙවීම

බදු යන්නෙහි අර්ථය.

96අ. මේ පරිච්ඡේදයෙහි "බදු" යන්නෙන්, යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම හෝ බද්දට යටත් ධනය හෝ බද්දට යටත් තෑගි හෝ සම්බන්ධයෙන් අය විය යුතු වන ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු අදහස් වේ.

බදු ගෙවීම.

96ආ. (1) 1972 අප්‍රේල් 1 වන දින සිට හෝ ඒ දිනයට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු යම් බද්දක්, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහු සම්බන්ධයෙන් තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද ඔහු විසින් වාර කොටස් හතරකින් කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය. ඒ එක් එක් වාර කොටස මෙහි මින් මතු "ත්‍රෛමාසික වාරිකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) 1972 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ප්‍රථම ත්‍රෛමාසික වාරික දෙක, 1973 ජනවාරි පසළොස් වැනි දින දී හෝ ඊට පෙර ද ඊළඟ ත්‍රෛමාසික වාරික දෙක පිළිවෙළින් 1973 පෙබරවාරි පහළොස්වැනි දින දී හෝ ඊට පෙර ද අප්‍රේල් තිස්වන දින දී හෝ ඊට පෙර ද ගෙවනු ලැබිය යුතු ය. ඉක්බිති යම් තක්සේරු වර්ෂයක් සඳහා ත්‍රෛමාසික වාරික පිළිවෙළින්, එම තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි පහළොස් වැනි දින දී හෝ ඊට පෙර සහ ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ අප්‍රේල් තිස්වන දින දී හෝ ඊට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(3) තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බදුවල ත්‍රෛමාසික වාරික මෙසේ විය යුතු ය:—

(අ) ප්‍රථම ත්‍රෛමාසික වාරිකය විය යුත්තේ, එම තක්සේරු වර්ෂය සඳහා අයවිය යුතු බද්දෙන් හතරෙන් කොටසකට සමාන ප්‍රමාණයකි ;

(ආ) දෙවන ත්‍රෛමාසික වාරිකය විය යුත්තේ, එම තක්සේරු වර්ෂය සඳහා අය විය යුතු බද්දෙන් එක් අඩක් සහ ප්‍රථම ත්‍රෛමාසික වාරිකයේ ප්‍රමාණය අතර ඇති වෙනසට සමාන ප්‍රමාණයකි ;

(ඇ) තෙවන ත්‍රෛමාසික වාරිකය විය යුත්තේ, එම තක්සේරු වර්ෂය සඳහා අය කළ යුතු බද්දෙන් හතරෙන් තුනක හා ප්‍රථම සහ දෙවන ත්‍රෛමාසික වාරිකවල ප්‍රමාණය හා අතර ඇති වෙනසට සමාන ප්‍රමාණයකි ;

(ඈ) සිවුවන ත්‍රෛමාසික වාරිකය විය යුත්තේ, එම තක්සේරු වර්ෂය සඳහා අය විය යුතු බද්දේ ප්‍රමාණය හා ප්‍රථම, දෙවන සහ තුන්වන ත්‍රෛමාසික වාරිකවල ප්‍රමාණය හා අතර වෙනස ය.

(4) තක්සේරු වර්ෂයක් සඳහා යම් බද්දක ත්‍රෛමාසික වාරිකය ගෙවන සෑම තැනැත්තකුම විසින් ඒ බද්ද ආදායම් බදු ද, ධන බදු ද නැත හොත් තෑගි බදු ද යන්න අනුව, එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම, ධනය හෝ තෑගි පිළිබඳ වූ ද කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක වූ ද වාර්තාවක් ඒ වාරිකය ගෙවන අවස්ථාවේ දී කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු ය. ඒ තැනැත්තාට අදාළ වන්නා වූ ද එම ආකෘතියේ සඳහන් කරනු ලබන්නා වූ ද කරුණුවලට සම්බන්ධ සියලු විස්තර ඔහු විසින් ඒ ආකෘතියේ දැක්විය යුතු ය.

(5) බද්දක ත්‍රෛමාසික වාරිකය හෝ ඒ වාරිකයෙන් කොටසක් (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි දී හෝ ඒ දිනයට පෙර හෝ නොගෙවන ලද අවස්ථාවක ඒ වාරිකය හෝ එහි ඒ කොටස හෝ ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. එය ගෙවිය යුතු තැනැත්තා හෝ එය එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් ගෙවිය යුතු වන අවස්ථාවක දී එකී එක් එක් තැනැත්තා හෝ ගෙවීම පැහැර හැරි තැනැත්තකු ලෙස මේ පනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. තවද බද්ද අයකර ගැනීම සම්බන්ධ මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(6) බද්දක ත්‍රෛමාසික වාරිකය හෝ ඒ වාරිකයෙන් කොටසක් හෝ ගෙවීම පැහැර හැරි අවස්ථාවක එසේ පැහැර හැරි තැනැත්තා විසින්,

ගෙවීම පැහැර හැර ඇති බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන්—

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට පහකට සමාන මුදලක් ; සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති මුදල එසේ පැහැර හැරීම පටන් ගැනීමෙන් පසුව තිස් දවසක් ඉකුත් වීමට පෙර නොගෙවන ලද අවස්ථාවක, එය ගෙවීම තවදුරටත් පැහැර හරිනු ලැබ තිබෙන එක් එක් තිස් දිනක කාල සීමාව හෝ ඒ කාල සීමාවෙන් කොටසක් හෝ සම්බන්ධයෙන්, ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට එකකට සමාන තවත් මුදලක්

ගෙවිය යුතු ය.

**තක්සේරු කරුවන් විසින් තක්සේරු කරනු ලැබීම.**

96ඇ. (1) තක්සේරුකරුගේ මතය අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් බද්දක් ගෙවිය යුතු යම් තැනැත්තකු විසින් එම තක්සේරු වර්ෂය සඳහා ඒ බද්දේ ත්‍රෛමාසික වාරිකය ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වාරිකය වශයෙන් ගෙවිය යුතුව තුබූ මුදල එම තක්සේරු වර්ෂය ඇතුළත හෝ එම තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් සය අවුරුද්දක් ඇතුළත හෝ තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි ය. තවද එසේ තක්සේරු කරන ලද බද්ද වහාම ගෙවන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(2) තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක ත්‍රෛමාසික වාරිකය පිළිබඳව (1) වන උප වගන්තිය යටතේ කරන ලද තක්සේරුවක් 96ආ වන වගන්තියේ සඳහන් කර ඇති දණ්ඩනයට ඒ තැනැත්තා යටත් වීම කෙරෙහි බල නොපෑ යුතු ය. ඒ වගන්තියේ කාර්යයන් සඳහා එසේ තක්සේරු කරන ලද ප්‍රමාණය එම වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තුබුණු ත්‍රෛමාසික වාරිකය ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) තක්සේරුකරුගේ මතය අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් බද්දක් ගෙවිය යුතු යම් තැනැත්තකු විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ බද්දේ ත්‍රෛමාසික වාරිකය වශයෙන් ගෙවිය යුතුව තිබුණු නියම මුදලට අඩු ප්‍රමාණයක් ඒ වාරිකය වශයෙන් ගෙවා තිබෙන අවස්ථාවක, තක්සේරුකරු නිශ්චය කරන පරිදි ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු ප්‍රමාණය එම තක්සේරු

වර්ෂය ඇතුළත හෝ එම තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් පසු සය අවුරුද්දක් ඇතුළත හෝ තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර, එසේ තක්සේරු කරන ලද මුදල හා එම තැනැත්තා විසින් ගෙවන ලද මුදල හා අතර වෙනස වහාම ගෙවන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහත දක්වුණු විධිවිධානවල කිසිවක් මේ උපවගන්තිය යටතේ තක්සේරුවක් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අතිරේක තක්සේරුවක් කිරීමෙන් තක්සේරුකරුවකු වළක්වන්නක් නොවිය යුතු ය.

(4) යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, එම උපවගන්තිය යටතේ දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් මුදලක් ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරන ලද අවස්ථාවක, ඒ මුදල සම්බන්ධයෙන්, 96අා වන වගන්තියේ සඳහන් දණ්ඩන මුදල ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතුය. එම වගන්තියේ කාර්යයන් සඳහා, එම මුදල, එම වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු නමුත් එසේ නොගෙවන ලද ත්‍රෛමාසික වාරිකය ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) තක්සේරු දැන්වීම, අභියාචනා කිරීම සහ වෙනත් කෘත්‍ය පිළිබඳව මේ පනතෙහි ඇති විධිවිධාන, මේ වගන්තිය යටතේ කරනු ලබන යම් තක්සේරු කිරීමකට හා ඒ තක්සේරු කිරීමෙන් අය කරනු ලබන යම් බද්දකට අදාළ විය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 105 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ඇතැම් අවස්ථාවලදී බද්ද අඩු කිරීම.

105. (අ) 1973 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු ගෙවීමට යටත් වන ධන බද්දේ, සහ

(ආ) එම තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා ගෙවීමට යටත්වන ආදායම් බද්දේ

මුළු එකතුව එම තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් සියයට අසූවකට වැඩි වේ නම් ඒ වැඩි මුදල ඔහු ගෙවීමට යටත් ධන බද්දෙන් හිලව් කළ යුතුය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 106 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

'බදු ගෙවීම පිළිබඳ විධිවිධාන.

106. (1) 96අා වන වගන්තියේ හා 107 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තක්සේරු කිරීමකින් අය කරනු ලබන ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද ඒ තක්සේරු දැන්වීමෙ හෝ ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තාට කරනු ලබන වෙන යම් දැන්වීමක නිශ්චිතව සඳහන් දිනයක හෝ ඊට පෙර එකවරම හෝ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි හතරකට වැඩි නොවන වාරික ගණනකින්, එකී බද්ද ගෙවීමට යටත් තැනැත්තා විසින් ගෙවිය යුතු ය. මේ වගන්තියේ මින් මතු අන්‍ය විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ඉහත කී පරිදි ගෙවනු නොලැබූ යම් බද්දක් හෝ එම බදු වාරිකයක් ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද හෝ එහි වාරිකය ගෙවිය යුතු තැනැත්තා හෝ ඒ බද්ද හෝ එහි ඒ වාරිකය එක් කෙනකුට වැඩි තැනැත්තන් ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති විට එකී තැනැත්තන්ගෙන් එක් එක් පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරයෙහි එක් එක් හවුල්කරු පැහැර හරින්නකු ලෙස මේ පනතේ කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

(2) ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු ආණ්ඩුව විසින් තමාට ගෙවනු ලැබීමට ඇති නිශ්චිත යම් මුදලකින් හෝ ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ හෝ ලංකා තැපැල් කාර්යාලීය ඉතිරි කිරීමේ බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තමාගේ බැරට ඇති මුදල්වලින් හෝ කොමසාරිස්වරයා අනුමත කළ යම් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදලකින් තමාට ගෙවනු ලැබීමට ඇති මුදල්වලින් ඒ බද්ද හෝ වාරිකය ගෙවීමට කටයුතු පිළියෙළ කර ඇති බවට ඒ බද්ද හෝ වාරිකය ගෙවීමට තමාට නියම කර ඇති දිනයෙහි හෝ එදිනට පෙර කොමසාරිස්වරයා සෑහීමට පත් කරන්නාවූත් ඒ බද්ද හෝ වාරිකය ගෙවීමට කොමසාරිස්වරයා ඒ තැනැත්තාට වැඩි කළ කාලයක් දෙන්නාවූත් අවස්ථාවක, ඒ වැඩි කර දෙන ලද කාලය ගත වන තුරු ඒ බද්ද හෝ වාරිකය, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(3) මිය ගිය තැනැත්තකුගේ බූදලයෙන් අය විය යුතු යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ තෑගි බද්දක් සම්බන්ධයෙන්, ඒ මියගිය තැනැත්

තාගේ බුදල් බලකරුවකු විසින්, ඒ බද්ද හෝ එහි යම් වාරිකයක් ගෙවීමට තමාට නියම කර ඇති දිනයෙහි හෝ එදිනට පෙර, අන්තිම කැමති බලපත්‍රය හෝ බුදල් පරිපාලන බලපත්‍රය තමා වෙත නිකුත් කර නොමැති නිසා ඒ බද්ද හෝ වාරිකය එම දිනයෙහි හෝ ඊට පෙර ගෙවිය නොහැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත් කරන්නා වූ අවස්ථාවක, ඒ මුදල හෝ වාරිකය අන්තිම කැමති බලපත්‍රය හෝ බුදල් පරිපාලන බලපත්‍රය නිකුත් කළ දිනයෙන් පසු මාස දෙකක කාලයක් ඇතුළත ගෙවනු ලැබුවහොත් ඒ මුදල හෝ වාරිකය ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතු ය.

මේ උප වගන්තියෙහි "බුදල් බලකරු" යන යෙදුමට මියගිය තැනැත්තකුගේ දේපළෙහි සන්තකය ලබා ගන්නා හෝ ඒ දේපළ සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත් වන තැනැත්තෙක් ඇතුළත් නොවේ.

(4) 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ ලාභවලට හෝ ආදායමට—

(අ) එම තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී ඔහු විසින් පවත්වා ගෙන යාම නතර කරන ලද යම් වෙළඳාමකින් හෝ ව්‍යාපාරයකින් හෝ කිරීම නතර කරන ලද යම් වෘත්තියකින් හෝ රැකියාවකින් ලැබූ ලාභ හෝ ආදායම සහ එම තක්සේරු වර්ෂයේ දී ආරම්භ කළ යම් සේවා නියුක්තියකින් ලැබූ ලාභ, හෝ

(ආ) එම තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් පවත්වාගෙන යාම නතර කරන ලද යම් වෙළඳාමකින් හෝ ව්‍යාපාරයකින් හෝ කිරීම නතර කරන ලද යම් වෘත්තියකින් හෝ රැකියාවකින් ලැබූ ලාභ හෝ ආදායම් සහ එම තක්සේරු වර්ෂයේ දී ආරම්භ කළ යම් සේවා නියුක්තියකින් ලැබූ ලාභ

ඇතුළත් වන අවස්ථාවක, එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන්, තක්සේරුකරුගේ මතය අනුව ඒ වෙළඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රැකියාවෙන් ලැබුණු ලාභ හෝ ආදායම හා ඒ සේවා නියුක්තියෙන් ලැබුණු ලාභ යන මේ දෙකෙන් අඩු ප්‍රමාණය වෙනුවෙන් වූ බද්ද ලෙස සැලකිය හැකි ප්‍රමාණය, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක්

සඳහන්ව ඇත ද, එම තක්සේරු වර්ෂය අවසාන වී අවුරුදු තුනක් ඉකුත්වීමට පෙර ගෙවිය හැකි ය.

(5) තක්සේරුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත ද ඒ අභියාචනයේ ප්‍රතිඵල ලැබෙන තෙක් යම් බද්දක් හෝ එහි යම් කොටසක් ගෙවීම පසුවට තබන ලෙස කොමසාරිස්වරයා නියම කළ හොත් මිස, එය ගෙවිය යුතු ය. එසේ ගෙවීම පසුවට තබන ලද බද්දේ හෝ ඒ කොටසේ මුදල ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ ගෙවීම පසුවට තබන ලද බද්ද හෝ එහි යම් කොටසක් අය කර ගත නොහැකිවීමට ඉඩ ඇති බව හෝ අභියාචකයා තම අභියාචනයේ කටයුතු අයුක්ති සහගත ලෙස ප්‍රමාද කරන බව කොමසාරිස්වරයාගේ මතය වූ අවස්ථාවක, තමා ඒ උපවගන්තිය යටතේ කළ නියමය අවලංගු කර, කාරණයට අවශ්‍යයැයි ඔහුට පෙනී යා හැකි යම් අලුත් නියමයක් ඔහු විසින් කරනු ලැබිය හැකි ය. අලුත් නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයේ දී හෝ ඊට පෙර නොගෙවන ලද යම් බද්දක මුදල ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(7) XII වන පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳ අවසාන නිශ්චය කරනු ලැබූ විට හෝ කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් නියමයක් අනුව (5) වන උපවගන්තිය යටතේ ගෙවීම පසුවට තබන ලද යම් බද්දක් ගෙවිය යුතු බවට පත්වන අවස්ථාවක හෝ මුල් තක්සේරුවෙන් නියම කරන ලද බද්ද වැඩි කරනු ලැබූ අවස්ථාවක, යම් බද්දක් හෝ බද්දක ශේෂයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද ඒ දිනය නියම කරමින් කොමසාරිස්වරයා විසින් අභියාචක වෙත ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය. ඒ අනුව ගෙවනු නොලැබූ යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(8) මේ වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද බද්ද ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් පිට පසුවට තබන ලද්දා වූ ද අවස්ථාවක, අභියාචනයේ යම් අවස්ථාවක දී එම තක්සේරුව වෙනුවෙන් යම් කිසි මුදලක් තමාගෙන් අයවිය යුතුව ඇති බවට හෝ අයවිය යුතු වීමට ඉඩ ඇති බවට අභියාචක එකඟවුවහොත් කොමසාරිස්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්, එම මුදල එම දැන්වීමේ නිශ්චිත ව සඳහන් දිනයෙහි හෝ ඊට පෙර ගෙවන ලෙස ආයාචකට විධාන කළ හැකි ය.

එසේ නොගෙවන ලද යම් මුදලක් ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු අතර එම මුදල ගෙවිය යුතු තැනැත්තා, හෝ ඒ මුදල එක් කෙනකුට වැඩි තැනැත්තන් ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතු ව ඇති විට, ඒ එක් එක් තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරයෙහි එක් එක් හවුල්කරු පැහැර හරින්නකු ලෙස මේ පනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(9) යම් බද්දක් හෝ එහි යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හැර ඇති ප්‍රමාණයෙන් සියයට පහකට සමාන මුදලක් ඒ බද්දට හෝ වාරිකයට එකතු කළ යුතු අතර, එසේ එකතු කරන ලද මුදල ද සමග ඒ බද්ද හෝ වාරිකය, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි හෝ ඊට පෙර ගෙවන ලෙස නියම කරමින් ඒ බද්ද හෝ වාරිකය ගෙවිය යුතු තැනැත්තා වෙත කොමසාරිස් විසින් ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය. එසේ ගෙවීම කරනු නොලැබුවහොත්, කොමසාරිස්වරයා විසින්, ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් හෝ වාරිකයෙන් සියයට පහළොවකට වැඩි නොවන තවත් මුදලක් හෝ එවැනි මුදල් ගණනක් එම බද්ද හෝ වාරිකය අය කර ගන්නා තෙක් එයට එකතු කළ හැකි ය :

එසේ වුව ද ගෙවීම පැහැර හැර ඇති බද්දට XIඅ වන පරිච්ඡේදය යටතේ යම් මුදලක් හෝ එවැනි මුදල් ගණනක් එකතු කර ඇතහොත් මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ කිසිම මුදලක් හෝ එවැනි මුදල් ගණනක් එයට එකතු කරනු නොලැබිය යුතු ය.

(10) XII වන පරිච්ඡේදය යටතේ යම් අභියාචනයක් පිළිබඳ අවසාන නිශ්චය කිරීම කරනු ලැබූ විට, ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද (9) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ එවැනි මුදල් ගණනක් එකතු කර ඇත්තා වූ ද යම් බද්දක් අඩුකරණය කරනු ලැබූ අවස්ථාවක, එම මුදල හෝ මුදල් ගණන් එසේ අඩුකරණය කරනු ලැබූ බද්ද මත ගණන් බලනු ලැබිය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) (අ) 27(2), 47(1), 50(1), 52(2), 66(1), 82(1), (2), (3) හා (4), 82අ(1), 83(1) හා (2), 84, 85, 86 හෝ 115

යන මේ වගන්ති හෝ උපවගන්ති අතුරෙන් යමක් යටතේ තමාට කරන ලද දැන්වීමක නියමයන් ඉෂ්ට කිරීම නොකර හරින්නාවූ ; හෝ

(ආ) 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් තමාට කරන ලද නියමයක විධිවිධාන පිළිපැදීම නොකර හරින්නාවූ ; හෝ

(ඇ) 82(3) හා (4), 97(11) හෝ 101(6) වන වගන්ති අතුරින් යමක් යටතේ නිකුත් කරනු ලැබූ දැන්වීමක් ප්‍රකාර පැමිණ නොසිටින්නා වූ හෝ පැමිණ සිට නීත්‍යනුකූලව තමාගෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම යුක්ති සහගත හේතුවක් නොමැතිව නොකරන්නා වූ ; හෝ

(ඈ) 27(4), 47(3), 50(2අ), 52අ(1), 81(1), 82අ(2), 88(1), 107 (6) හෝ 109 (2) වන වගන්තිවල නියමයන් ඉෂ්ට කිරීම නොකරගරින්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ එක් එක් වරද සඳහා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.”.